

# නේපාල ව්‍යසනය
## මිනිසුන් මරා දැමුවේ භූමිකම්පාව නොව ගොඩනැගිලියි

**රසී වීරසිංහ**

**"එය පොඩි මිනිහාගේ නපුරු සිහිනයක් විය. මෙම මිනිසුන් මරා දමා ඇත්තේ භූමිකම්පාව නොව ගොඩනැගිලිය." කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ භූ කම්පන විද්‍යාඥ ජේම්ස් ජැක්සන්**

ඉකුත් සෙනසුරාදා නේපාලයේ බිහිසුණු භූමිකම්පාව සිදුවීමට හරියට සතියකට පෙර ආසියාවේ භූ කම්පන විපත්වලින් සිදුවන හානිය අවම කරගැනීම වෙනුවෙන් රටවල් 50 ක භූ කම්පන සමාජ විද්‍යාඥයන්ගේ හමුවක් කත්මණ්ඩු නගරයේදී පැවැත්විණි. මෙම හමුවට බලපෑ ප්‍රධාන කරුණ නම් 1934 වර්ෂයේදී දොළොස්දහසකට පමණ මරු කැඳවමින් සිදු වූ නේපාල - බිහාර භූමිකම්පාවට වසර 81 ක් ගතවීමය. 1934 ජනවාරි 15 වැනිදා සිදු

### ඉන්දියාව හිමාලය දෙසට තල්ලුවෙයි

### නේපාලයේදී මුදාහැරියේ හයිඩ්‍රජන් බෝම්බ 20ක් පිපිරීමේ බලයක්

### 1615දී භූමිකම්පාවකින් ලංකාවේ දෙදහසක් මැරිලා

වූ මෙම භූමිකම්පාව ගත වූ වසර දෙසීයක කාලය තුළ ලෝකයේ සිදු වූ දරුණුතම භූමිකම්පාවලින් එකක් බව භූ විද්‍යාඥයෝ පවසති.

නේපාල - බිහාර භූමිකම්පාවේ කම්පනය අවුරුදු 81 ක් පුරා නේපාල වැසියන් තැති ගැන්මට පත් කර තිබුණි. මේ කම්පනය නිසා පසුගිය දශක කීපය පුරාම භූ විද්‍යාඥයන්ගේ අවධානය නේපාලය වෙත යොමු වී තිබිණි. ප්‍රංශ පුවත් සේවයේ විද්‍යා ලිපි රචක සෙත් බියෝරෙස්ටියන් පවසන්නේ "ඔවුන් ඔර්ලෝසුව කැරකෙන බව දැන සිටියද සතුරා (භූමිකම්පාව) පහර දෙන වෙලාව දැන නොසිටි බවයි."

පසුගිය සෙනසුරාදා නේපාලයේ සිදු වූ භූමිකම්පා-වෙන් මියගිය ගණන දසදහස ඉක්මවිය හැකි බව නේපාල අගමැති සුෂිල් කොයිරාල පවසයි. නේපාලයේ භූමිකම්පන තාක්ෂණ ජාතික සංගමයේ වාර්තා පවසන්නේ සෑම වසර 75 කට වරක් ඉන්දියන් සහ යුරේසියන් භූ තල ගැටී දරුණු භූමිකම්පා හට ගන්නා බවයි. නේපාලයේ අවාසනාවට මෙම භූ තල සලකුණු වැටී ඇත්තේ කත්මණ්ඩු නගරය හරහාය. මේ භූ තලයන්හි සලකුණු, වර්ග කිලෝමීටර 14000 ක් පුරා විහිදී ගොස් තිබේ. පසුගිය අවුරුදු මිලියන 50 සිට මේ මොහොත දක්වා ඉන්දියානු හා යුරේසියානු භූ තල නිරන්තර එකිනෙකට ගැටෙමින් පවතින අතර එහි ප්‍රතිඵලයන් දෑස් ඉදිරිපිටම දැකගත හැක්කේ සුන්දර හිමාලය කඳුවැටිය දෙස බැලීමෙනි.




**භූමිකම්පාවක් ඇතිවන්නේ කෙසේද ?**

පෘථිවි ගෝලය සැදී ඇත්තේ ප්‍රධාන භූ තල දෙකකිනි. එම තල දෙක නම් සාගර තලය (oceanic plate) සහ මහද්වීපික (continental) තලයයි. මෙම මහද්වීපික තලය විශාල භූ තල අටකින් සහ කුඩා භූ තල නමයකින් සමන්විතය. එම භූ තල අස්ථායි ලෙස නිතර එහා මෙහා ගමන් කරමින් තිබේ. සමහර භූ තල ඉතා වේගයෙන් ගමන් කරන අතර ඇතැම් තල ඉතා සෙමින් ගමන් කරනු ලබයි. මෙසේ ගමන් කිරීමේදී මේ භූ තල මායිම්වල නිරන්තර ගැටීම් සිදුවේ. සමාන බල ඇති තල දෙකක් එකට ගැටීමෙන් මහද්වීපික තලය (මහ පොළව) ඉහළට එසවෙන අතර අසමාන බල ඇති තල ගැටීමෙන් ගිලාබැසීම් සිදුවිය හැක. සමහර භූ තල ඉතා සක්‍රිය වන අතර ඇතැම් තල අක්‍රිය තත්ත්වයේ පවතී. සක්‍රිය භූ තල ගැටීමෙන් භූමිකම්පා සහ ගිනි කඳු උපත ලබයි. සුමාත්‍රා භූ තල මායිම ඉතා සක්‍රිය වන අතර මේ හේතුවෙන් සුමාත්‍රා භූ තලයේ සතියකට භූමිකම්පා කීපයක් සිදු වේ. මෙමගින් බිහිවන ඉතා ප්‍රචණ්ඩ සාගර රළ තරංග, සුනාමි ලෙස හඳුන්වයි. මේවා පැයට කිලෝමීටර 400 ක පමණ වේගයෙන් ගමන් කරන අතර මීටර් 20 - 30 අතර උසකට මුහුදු රළ නිර්මාණය කරයි. මෙවැනි ප්‍රචණ්ඩ රළ ජපානය, හවායි, පිලිපීනය, චිලි, ආදී පෙදෙස්වල නිරන්තරයෙන් ඇති වේ. 2004 වසරේ දෙසැම්බර් 26 වැනිදා ලංකාවට බලපෑ සුනාමි තත්ත්වය මීට කදිම නිදසුනකි.

**පෘථිවි පෘෂ්ඨයේ ඇති ප්‍රධානතම භූ තල දෙකක් වන්නේ ඉන්දියානු සහ යුරේසියානු භූ තල දෙකය. නේපාලයේ භූමිකම්පාව සිදු වූයේ මෙම භූ තල එකට ගැටීමෙනි.** ඉන්දියානු භූ තලය පෘථිවි ගෝලයේ ඊසාන සහ උතුරු දෙසට ගමන් කරමින් යුරේසියානු භූ තලයේ ගැටීම තීව්‍ර කරමින් සිටී. මේ හේතුවෙන් පකිස්ථානය, ඉන්දියාව, නේපාලය, චීනය, රටවල දරුණු භූමිකම්පා සිදුවීම් දිනෙන් දින ඉහළ යමින් තිබේ. නිරන්තර සිදුවන මෙම භූ තල දෙකේ ගැටීමෙන් ඉන්දියාව වසරකට සෙන්ටිමීටර 5 ක් උතුරු ආසියාව දෙසට තල්ලු වී යන අතර හිමාලය කඳු වැටියේ උස වසරකට සෙන්ටිමී-